## සෞඛ්‍යය සේවා

යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට ආරෝග්‍ය ශාලා නොමැත. අඩු වශයෙන් ප්‍රසූත මධ්‍යස්ථානයක් හෝ නොමැත. ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන මගින් සෞඛ්‍ය සායන පමණක් පැවැත්වේ. කොට්ඨාසය සඳහා මාතෘ ප්‍රසූතාගාරයක් නොමැති අතර එම කටයුතු ගාල්ල මහමෝදර ශික්ෂණ රෝහලෙන් හා උඩුගම මූලික රෝහලින් සහ ඉමදූව ග්‍රාමීය රෝහල මගින් ඉටුකර ගනු ලබයි. යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන ගණන 15 ක් පමණ පිහිටුවා ඇත. මෙම ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන යක්කලමුල්ල ප්‍රාදේශීය සෞඛ්‍යසේවා අධ්‍යක්ෂ කාර්යාලය මගින් පාලනය කරනු ලබයි.

## සෞඛ්‍ය මධ්‍යස්ථාන

| සෞඛ්‍ය මධ්‍යස්ථාන පිහිටි ස්ථානය | ලිපිනය |
|---|---|
| • යක්කලමුල්ල | සෞඛ්‍යවෛද්‍ය නිලධාරී කාර්යාලය,යක්කලමුල්ල |
| • ඇල්ලඉහල | ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය,ඇල්ලඉහළ, මාගෙදර |
| • පොල්පාගොඩ | ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය,16 කණුව, පොල්පාගොඩ |
| • පහළ වල්පල | ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය, වල්පල |
| • කොට්ටව | ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය ,10 කණුව,කොට්ටව |
| • කරාගොඩ | ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය, කරාගොඩ |
| • නාවල | ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය ,නාවල,නාකියාදෙණිය. |
| • තෙල්ලඹුර | ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය ,තෙල්ලඹුර |
| • නාකියාදෙණිය | ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය ,නාකියාදෙණිය |
| • තල්ගම්පල | ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය ,තල්ගම්පල |
| • නබදව | ග්‍රාමෝධය සෞඛ්‍ය මධ්‍යස්ථානය ,ගහලකොළදෙණිය(නබදව) |
| • තලංගහ | ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානය, තලංගහ |
| • මාගෙදර | ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානය, මාගෙදර |
| • මොරකැටිය | ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානය, මොරකැටිය |
| • බදුංගල | ග්‍රාමෝදය සෞඛ්‍ය මධ්‍යස්ථානය, බදුංගල |

## වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන (බෙහෙත් ශාලා)

1. යක්කලමුල්ල මධ්‍යම බෙහෙත් ශාලා 01
2. නාකියාදෙණිය මධ්‍යම බෙහෙත් ශාලා 01
3. තලංගහ බෙහෙත් ශාලා 01
4. යක්කලමුල්ල ආයුර්වේද බෙහෙත් ශාලා 01
5. නැවුංගල ආයුර්වේද බෙහෙත් ශාලා 01

**පෞද්ගලික අංශයේ ප්‍රතිකාර මධ්‍යස්ථාන**

| අනු අංකය | බෙහෙත් ශාලා වර්ගය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ඉංග්‍රීසි බෙහෙත් ශාලා | 18 |
| 02 | ආයුර්වේද බෙහෙත් ශාලා | 04 |
| 03 | දන්ත ශල්‍යාගාර | 02 |

## රෝග ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු

| අංකය | රෝගය | වාර්තා වූ රෝගීන් සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | **2022 වර්ෂය** | **2023 වර්ෂය** |
| 1 | පැපොල රෝගය (Chicken Fox) | 05 | 04 |
| 7 | කම්මුල්ගාය | 02 | - |
| 8 | ඩෙංගු ( Dengu Fever) | 24 | 13 |
| 9 | මී උණ ( Leptospirosis) | 37 | 16 |
| 10 | ක්ෂය රෝගය | 17 | 03 |
| 11 | මැලේරියා ව ( Malaria) | - | - |

ඩෙංගු රෝගය, මී උණ, වෛරස් උණ සහ ක්ෂය රෝගය , අනෙක් රෝග වලට සාපේක්ෂව වැඩි ව්‍යාප්තියක් දක්නට ඇත. ඩෙංගු රෝගය සම්බන්ධයෙන් රෝගය වැලැක්වීමට අදාල විවිධ වූ වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇත. ඒ අනුව ඩෙංගු රෝගීන් වාර්ථාවන ග්‍රාම නිලධාරී කොට්ඨාස තුල මාසිකව ඩෙංගු මර්ධන වැඩසටහන් පවත්වනු ලැබේ.

- මී උණ රෝගය විශේෂයෙන් කුඹුරු වැඩ ආරම්භ වීමත් සමග වාර්තා වන අතර, අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම සහ ගොවීන් අතරේ ඖෂධ බෙදාදීම සිදුකර ඇත.
- ක්ෂය රෝගීන් විමර්ශන කටයුතු සිදුකර අදාල ස්ථාන වලට වාර්ථා කිරිම් සිදුකරන අතර, විශේෂයෙන් වතු ආශ්‍රිතව මෙහි වැඩි ව්‍යාප්තියක් දක්නට ලැබේ.
- යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බෙහෙත් ගබඩා පිහිටා නැත. ගබඩා කිරිම සදහා අවශ්‍ය ශීතකරණ පහසුකම් ද නොමැත. අවශ්‍ය බෙහෙත් වර්ග උණවටුන ප්‍රධාන ශීතකරණ ගබඩාවෙන් ගෙන්වා එදිනෙදා බෙදා හැරීමේ වැඩපිළිවෙලක් දැනට ක්‍රියාත්මක වේ.
- පෞද්ගලික අංශයේ ඖෂධ අලෙවි මධ්‍යස්ථාන දෙකක් (02) ඇති අතර සිංහල බෙහෙත් අලෙවිසැල් දෙකක් (02) ද කොට්ඨාසය තුළ පිහිටා ඇත.

- ග්‍රාමීය  ආරෝග්‍ය ශාලාවක් හෝ මාතෘ රෝහලක් මෙහි නොමැති අතර , රෝගීන්ට ප්‍රතිකාර මධ්‍යස්ථාන තුනක් (03) ඇත. තලංගහ රාජ්‍ය වතු සමාගමට අයත් භූමියේ එක් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පිහිටුවා ඇත.

## රෝග ව්‍යාප්තිය

කොට්ඨාසයේ වසංගතයක් ලෙස පවතින රෝගයක් ලෙස 2021,2022 වර්ෂ වල කොවිඩ් 19 රෝගය සීග්‍රයෙන් රට පුරා ව්‍යාප්ත වූ අතර නිදන්ගත රෝග පවතින පුද්ගලයින් ජීවිතක්ෂයට පත්වීම දක්නට ලැබුණි. 2021 වර්ෂයේ කොඩ්ඩ් රෝගය නිසා මිය ගිය පුද්ගල සංඛ්‍යාව ඉහළ ගිය බැවින් එයින් ආරක්ෂා වීම සඳහා රජය විසින් එන්නත් කරණ වැඩපිළිවෙලක් ආරම්භ කළ අතර, එය වැඩිහිටි,තරුණ හා පාසල් ළමුන් වශයෙන් කණ්ඩායම් කිහිපයක් යටතේ සිදු කරණ ලදි.

## දේශීය  ආයුර්වේද වෛද්‍ය කටයුතු

කොට්ඨාසය තුල දේශීය ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයක් කොට්ටව නැවුංගල පිහිටුවා ඇති අතර දේශීය ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම මෙම වෛද්‍ය මධ්‍යස්ථානය හා දැනට යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව මගින් පවත්වාගෙන යනු ලබන ආයුර්වේද මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මීට අමතරව කොට්ඨාසය තුල ලියාපදිංචි දේශීය ආයුර්වේද  වෛද්‍යවරුන් දෙදෙනෙකු ආයුර්වේද වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සිදු කරයි.